සුභසාධක ප්‍රතිලාභ මණ්ඩලය

நலன்புரி நன்மைகள் சபை

WELFARE BENEFITS BOARD

මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சு

Ministry of Finance, Economic Stabilaization & National Policies

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව. | செயலகம், கொழும்பு 01, இலங்கை. | The Secretariat, Colombo 01, Sri Lanka.

| මගේ අංකය / எனது இல / My No. | WBB/Notice/D/Divi/2024 | අංකය / து இல / No | | දිනය / திகதி / Date | 2024.03.26 |
|---|---|---|---|---|---|

WBB/Circular/No08/2024

සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් / නියෝජ්‍ය සුබසාධක ප්‍රතිලාභ කොමසාරිස්වරුන් වෙත

**<u>අස්වැසුම සුභසාධක ප්‍රතිලාභ වැඩසටහනේ දෙවන අදියරේ අයදුම්පත් කැඳවීම - පද්ධතියට ඇතුළත් කළ නොහැකි අයදුම්පත් සම්බන්ධයෙන් ක්‍රියා කිරීම</u>**

අස්වැසුම සුභසාධක ප්‍රතිලාභ වැඩසටහන දෙවන අදියර යටතේ අයදුම්පත් කැඳවීමට අනුව මාර්ගගත ක්‍රමයට අයදුම් නොකර ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට භාර දෙනු ලැබූ අයදුම්පත් සම්බන්ධයෙන් පහත පරිදි ක්‍රියා කරන ලෙස කාරුණිකව දන්වමි.

01. අයදුම්පත් බාර ගැනීමේ කාලය 2024.03.22 දිනෙන් අවසන් වුවද මෙතෙක් භාරගෙන IWMS පද්ධතියට ඇතුළත් කර නොමැති අයදුම්පත් ඇතුළත් කිරීම සඳහා 2024.04.01 දින දක්වා කල් ලබා දෙනු ලැබේ.

02. අයදුම්පත් මෙසේ පරිගණක පද්ධතියට ඇතුළත් කිරීමේ දී පහත සඳහන් වර්ග දෙකට අයත් අයදුම්පත් ඉදිරිපත්ව තිබුණහොත් ඒවා ඇතුළත් කළ නොහැකි බැවින් ඒවා වෙන වෙනම වෙන්කරවා ගත යුතුය.

    I. පළමු අදියරේ දී අයදුම්කර QR කේතයක් ලබාගෙන ඇති අයදුම්කරුවන්ගේ අයදුම්පත්.

    II. ජාතික හැඳුනුම්පත් නොමැති පුද්ගලයන් සහිත පවුල්වල අයදුම්පත්.

03. QR කේතයක් කලින් ලබාගෙන ඇති තැනැත්තන් විසින් ඉදිරිපත් කර ඇති අයදුම්පත් නුදුරු අනාගතයේදීම ක්‍රියාත්මක කිරීමට නියමිත දත්ත යාවත්කාලීන කිරීමේ ක්‍රියාවලිය සඳහා උපයෝගී කර ගැනීම පිණිස වෙන්කර තබාගත යුතුය. එමෙන්ම එම තැනැත්තන්ට ඇමුණුම I ආකෘතිය ප්‍රකාරව ලිපියක් සකස් කර අත්සන් කර යැවිය යුතුය.

04. ජාතික හැඳුනුම්පත් නොමැති හේතුවෙන් පද්ධතියට ඇතුළත් කළ නොහැකි පුද්ගලයන් සම්බන්ධයෙන් ඇමුණුම II ආකෘතිය ප්‍රකාරව ලිපියක් සකස් කර අත්සන් කර නිකුත් කළ යුතුය.

05. ආබාධිත තත්ත්වය නිසා හෝ රෝගී තත්ත්වයක් නිසා හෝ වයෝවෘද්ධ වීම නිසා සහ පවුලේ හැකියාව ඇති වෙනත් වැඩිහිටි පුද්ගලයෙකු ද නොමැති වීම නිසා මේ වන විටත් අයදුම්පත් ඉදිරිපත් කිරීමට අපේක්ෂාවෙන් සිටියද එසේ කිරීමට අපොහොසත් වූ පුද්ගලයන් පිළිබඳව ග්‍රාම නිලධාරි හා අදාළ විෂය භාර ක්ෂේත්‍ර නිලධාරීන් මගින් සොයා බලා ඔවුන්ගේ අයදුම්පත් යොමු කරවීමට සුදුසු වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කළ යුතුවේ.

Scanned with CamScanner

06. එවැනි තැනැත්තන්ගේ අයදුම්පත් පමණක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ගෙන්වාගෙන පරිගණක පද්ධතියට ඇතුළත් කිරීම සඳහා 2024 අප්‍රේල් මස 12 දින දක්වා කල් ලබා දෙනු ලැබේ. එහිදී සාමාන්‍ය පුද්ගලයන්ට එම අවස්ථාව ලබා නොදිය යුතු අතර පොදු සන්නිවේදනය වෙනුවට අදාළ පුද්ගලයන්ට පමණක් සන්නිවේදනය කිරීමේ වැඩපිළිවෙළක් යොදාගත යුතුය. එවැනි පුද්ගලයන්ට ජාතික හැඳුනුම්පත් නොමැති නම් නිවාසවලට ගොස් අවශ්‍ය ලියකියවිලි ලබාගෙන ජාතික හැඳුනුම්පත් සකස් කර දීම සඳහා ද අදාළ ක්ෂේත්‍ර නිලධාරීන් මගින් විශේෂ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරන ලෙස දන්වමි.

07. මෙම උපදෙස් සම්බන්ධයෙන් ඔබගේ කාර්යාලයේ මෙම විෂයයට සම්බන්ධවන සියළුම කාර්යාලිය හා ක්ෂේත්‍ර නිලධාරීන් දැනුවත් කර මෙම වැඩපිළිවෙළ කඩිනමින් ක්‍රියාත්මක කරන මෙන් වැඩිදුරටත් දන්වමි.

ජයන්ත වික්‍රමරත්න
සභාපති/ කොමසාරිස්

o1c

.............................................. (නම)

..............................................

.............................................. (ලිපිනය)

..............................................

**<u>අස්වැසුම සුභසාධක ප්‍රතිලාභ වැඩසටහනේ දෙවන අදියර සඳහා ඉදිරිපත් කරන ලද අයදුම්පත්‍රය සම්බන්ධයෙන් ඉදිරි පියවර ගැනීම</u>**

ඔබ විසින් අස්වැසුම සුභසාධක ප්‍රතිලාභ වැඩසටහනේ දෙවන අදියරේ අයදුම්පත් කැඳවීම අනුව ඉදිරිපත් කරන ලද අයදුම්පත සම්බන්ධයෙනි.

02. අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ දන්වා තිබූ පරිදි අස්වැසුම සුභසාධක ප්‍රතිලාභ වැඩසටහනේ පළමු අදියරේ දී අයදුම් කරන ලද හා ඒ අනුව QR කේතයක් ලැබී ඇති තැනැත්තන්ගේ පවුල්වලට අදාළව දෙවන අදියරේ දී අයදුම් කල නොහැක.

03. එබැවින් ඔබගේ අයදුම්පත දෙවන අදියර සඳහා ඇතුළත් කළ නොහැකි බව කාරුණිකව දන්වමි. එහෙත් නුදුරේදී පළමු අදියරේ ප්‍රතිලාභ සඳහා අයදුම්කර සුදුසුකම් ලද හෝ නොලද තැනැත්තන්ට තම තොරතුරු සංශෝධනය සඳහා ඉඩ ලබා දී නැවත තෝරා ගැනීමකට ලක්කරන බවත් ඒ සඳහා ඔබගේ අයදුම්පත වෙනම තබාගන්නා ලද බවත් වැඩි දුරටත් දන්වමි.

ප්‍රාදේශීය ලේකම් / නියෝජ්‍ය සුබසාධක ප්‍රතිලාභ කොමසාරිස්

ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

..........................................

Scanned with CamScanner

.............................................. (නම)

..............................................

.............................................. (ලිපිනය)

..............................................

**<u>අස්වැසුම සුභසාධක ප්‍රතිලාභ වැඩසටහනේ දෙවන අදියර සඳහා ඉදිරිපත් කරන ලද අයදුම්පත්‍රය සම්බන්ධයෙන් පියවර ගැනීම</u>**

ඔබ විසින් අස්වැසුම සුභසාධක ප්‍රතිලාභ වැඩසටහනේ දෙවන අදියර සඳහා මෙම කාර්යාලයට ඉදිරිපත් කරන ලද අයදුම්පත්‍රය සම්බන්ධයෙනි.

02. මෙම වැඩසටහන සඳහා අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ දන්වා තිබූ පරිදි අයදුම් කිරීම සඳහා අයදුම්කරු හා පවුලේ සාමාජිකයන් වෙත ජාතික හැඳුනුම්පතක් තිබීම අත්‍යාවශ්‍ය වේ. අයදුම්පත්‍රයේ සඳහන් තොරතුරු අනුව ඔබ ඉහත අවශ්‍යතාවය සපුරා නොමැති බැවින් මෙම වැඩසටහන සඳහා අදාළ අයදුම්පත ඇතුළත් කළ නොහැකි බව කාරුණිකව දන්වමි.

03. තවද ඔබ විසින් නැවත ඉදිරියේ දී අයදුම් කිරීමට අපේක්ෂා කරන්නේ නම් පවුලේ වයස අවුරුදු 18ට වැඩි සියළුම සාමාජිකයන් ජාතික හැඳුනුම්පත් ලබා ගැනීමට පියවර ගත යුතු බවද වැඩිදුරටත් දන්වා සිටිමි.

ප්‍රාදේශීය ලේකම් / නියෝජ්‍ය සුබසාධක ප්‍රතිලාභ කොමසාරිස්

ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

.........................................

Scanned with CamScanner